# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2026.06.15 පැය 1800 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/973/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**වෙඩි තබා පුද්ගලයින් පස් දෙනෙකු ඝාතනය කිරීමට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

**නැගෙනහිර පළාත තුල 2008.01.09 වන දින හිටපු පොලිස් නිලධාරියෙකු හා තවත් පුද්ගලයෙකු කල්අඩි ප්‍රදේශයේ මුරුගන් කෝවිල අසල ක්‍රීඩාපිටිය අසලදී ටී 56 ගිනි අවියකින් වෙඩි තබා ඝාතනය කිරීම හා 2008.05.22 වන දින කාත්තන්කුඩි පොලිස් වසමේ ප්‍රධාන වීදියේදී වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කිරීම.**

මෙම අපරාධයන්ට අදාලව සැකකරුවන් තිදෙනෙකු සම්බන්ධයෙන් 2026.06.15 වන අද දින මඩකලපුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති අතර පළමු සැකකරු විදෙස් ගතව ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. දෙවන සැකකරු ලෙස නම් කර සිටින සැකකරු 2025.08.13 වන දින සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගනිමින් වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරන ලදී.

**2008.08.20 වන දින රාත්‍රී කාලයේ වව්නතිව් පොලිස් වසමේ කොත්තියාපොල කන්නන්කුඩා ප්‍රදේශයේදී නාඳුනන අවිගත් පුද්ගලයින් පිරිසක් විසින් පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කිරීම.**

මෙම අපරාධය සම්බන්ධයෙන් සැකකරුවන් තිදෙනෙකු නම් කර සිටින අතර පළමු සැකකරු ඉහත සඳහන් මඩකලපුව පොලිස් වසමේ කල්අඩි හා කාත්තන්කුඩි ප්‍රදේශවල සිදු කරන ලද මනුෂ්‍ය ඝාතන වලට සම්බන්ධ දැනට විදෙස් ගතව සිටින බවට අනාවරණය වී ඇති සැකකරු වේ. දෙවන සැකකරු 2025.11.13 වන දින සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවා තබා ගනිමින් වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරන ලදී.

**ඉහත සඳහන් පුද්ගලයින් පස් දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධ සඳහා තුන්වන සැකකරු වශයෙන් නම් කර සිටින ශිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන් යන සැකකරු මඩකලපුව විශ්ව විද්‍යාලයේ හිටපු උප කුලපති ඝාතන සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන වැලිකඩ රක්ෂිත බන්ධනාගාර ගතව සිටින අතර මෙම නඩුව නැවත කැඳවීමට නියමිත දින සැකකරු මඩකලපුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට බන්ධනාගාර අධිකාරිවරයාට නියෝග කර ඇත.**

රැඳවුම් නියෝග මත සිටි සැකකරුවන් දෙදෙනා 2026.06.15 වන අද දින මඩකලපුව ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**